// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2039/35 - 2017 ඔක්තෝබර් මස 06 වැනි සිකුරාදා - 2017.10.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී )

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

බස්නාහිර පළාත්, තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය

2000 අංක 06 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න කර බස්නාහිර පළාත් අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු, ක්‍රීඩා හා යෞවන කටයුතු හා තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යවරයා විසින් සකස් කරන ලද නව **"2017 අංක 01 දරන බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය"** පහත දැක්වේ. මෙම නව ප්‍රඥප්තිය 2017.09.12 වැනි දින සිට බලපැවැත්වේ.

**කේ. ඩබ්ලිව්. රංජිත් සෝමවංස,**
අධ්‍යාපන, සංස්කෘතික හා කලා කටයුතු,
ක්‍රීඩා හා යෞවන කටයුතු හා
තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍ය,
බස්නාහිර පළාත.

2017 ඔක්තෝබර් මස 04 වැනි දින,
බත්තරමුල්ල දීය.

1A PG3720— 37 (2017/10)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**2017 අංක 01 දරන**
**බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය**

බස්නාහිර පළාතේ පළාත් සභාවට පැවරී ඇති විෂයයන්ට අදළ කාර්යයන් හා කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා වූ තොරතුරු හා සන්නිවේදන කාර්යයන් විධිමත්ව, කාර්යක්ෂමව හා ඵලදයී ලෙස යොද ගැනීම සඳහා ද පද්ධති හා ක්‍රම විශ්ලේෂණය හා වර්ධනයත්, පරිගණක තාක්ෂණය හා ඒ ආශ්‍රිත කටයුතු විධිමත් හා පුළුල් කිරීම සඳහා ද, තොරතුරු තාක්ෂණ සංවර්ධනයේ ප්‍රතිලාභ ජනතාවට ලබා දීම සඳහා ද ඊට අනුශාංගික කාරණා සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා ද, 2000 අංක 06 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය පරිච්ඡින්න කිරීම සඳහා වූ ද ප්‍රඥප්තියකි.

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ* බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

ලුහුඬු නාමය හා ක්‍රියාත්මක වන දිනය.

1. මෙම ප්‍රඥප්තිය 2017 අංක 01 දරන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරි ප්‍රඥප්තිය වශයෙන් හඳුන්වනු ලබන අතර, බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලද දින සිට ක්‍රියාත්මක වන්නේ ය.

## I වන කොටස

### බස්නාහිර පළාත් තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම හා එහි සංයුතිය

තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය පිහිටුවීම.

2. (1) මෙහි මින් මතු ''අධිකාරිය'' යනුවෙන් සඳහන් කරනු ලබන බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන අධිකාරිය වශයෙන් හඳුන්වනු ලබන අධිකාරියක් මෙයින් පිහිටුවනු ලැබේ.

(2) අධිකාරිය අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති ස්වකීය නාමයෙන් නඩු පැවරීමට හා නඩු පවරනු ලැබීමට හැකි සංස්ථාපිත ආයතනයක් වේ.

අධිකාරියේ කළමනාකරණ මණ්ඩලය.

3. අධිකාරියේ කටයුතු පිළිබඳ පරිපාලනය හා කළමනාකරණය පහත විධිවිධාන සලසා ඇති ආකාරයට පත් කරනු ලබන (මෙහි මින් මතු මණ්ඩලය වශයෙන් හඳුන්වනු ලබන) කළමනාකරණ මණ්ඩලය වෙත පවරනු ලැබිය යුතු අතර, එම කළමනාකරණ මණ්ඩලය, නිල සාමාජිකයන් සිව් දෙනෙකුගෙන් ද (04) අමාත්‍යවරයා විසින් පහත සඳහන් අය අතුරින් පත් කරනු ලබන සාමාජිකයින් තිදෙනෙකුගෙන් ද (03) සමන්විත විය යුතුය.

*(අ)* නිල බලයෙන් පත් වන සාමාජිකයන් :

(i) බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (පිරිස් හා පුහුණු)
(ii) බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (මුල්‍ය)
(iii) බස්නාහිර පළාතේ නියෝජ්‍ය ප්‍රධාන ලේකම් (ඉංජිනේරු)
(iv) බස්නාහිර පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ

*(ආ)* අමාත්‍යවරයා විසින් පහත සඳහන් අයගෙන් පත් කරනු ලබන නියෝජිතයන් තිදෙනෙක් :

(i) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය, ව්‍යාපාර කළමනාකරණය හා නීතිය යන ක්ෂේත්‍රයන්ට අදළ අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද ඇති දෙදෙනෙකු හා ;

(ii) තවත් එක් අයකු ප්‍රධාන අමාත්‍යවරයා විමසා පත් කරනු ලැබිය යුතු අතර, එසේ පත් කරනු ලබන තැනැත්තා අධිකාරියෙහි සභාපතිවරයා වශයෙන් පත් කළ යුතු ය.

සාමාජිකයෙකු වීමට නුසුදුසුකම්.

4. යම් තැනැත්තෙකු -

(1) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු, පළාත් සභා මන්ත්‍රීවරයෙකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු / මන්ත්‍රීවරයෙකු වන්නේ නම්; හෝ

(2) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු නොවන්නේ නම්; හෝ

(3) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්නා යම් නීතියක් යටතේ සිහි විකල් තැනැත්තෙක් බවට තීරණය කර ඇත්නම් හෝ ප්‍රකාශ කරනු ලැබ ඇත්නම්; හෝ

(4) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් නියම කරන ලද බන්ධනාගාර ගත කිරීමේ දණ්ඩන නියමයකට යටත්ව සිටී නම් හෝ සිටියේ නම්; හෝ

(5) තොරතුරු තාක්ෂණය හා සම්බන්ධ ව්‍යාපාරයක් පවත්වාගෙන යන පෞද්ගලික ආයතනයක හිමිකරුවෙක් හෝ ඔහුගේ නියෝජිතයෙක් වන්නේ නම්; හෝ

එවැනි තැනැත්තෙකු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ එවන්නකු ලෙස දිගටම කටයුතු කිරීමට නුසුදුස්සෙකු වන්නේ ය.

5\. (1) අධිකාරියේ පත්කළ සෑම සාමාජිකයකුම, ඔහු පත් කරනු ලැබූ දිනයෙහි සිට ගණන් ගැනෙන හා ඔහු පත් කරනු ලබන අවස්ථාවේ අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන අවුරුදු තුනක් නොඉක්මවන කාලයක්, ධුරය දැරිය යුතුය. තවද 7 (1) උපවගන්තිය යටතේ ධුරයෙන් ඉවත් කරන ලද්දේ නම් මිස, නැවත පත් කරනු ලැබීමට සුදුස්සකු විය යුතු ය. *පත්කළ සාමාජිකයන්ගේ ධුර කාලය.*

(2) පත් කළ සාමාජිකයෙකු ධුරයෙන් ඉවත් කරන ලබන අවස්ථාවකදී හෝ ඉල්ලා අස්වන අවස්ථාවකදී නැවත පත් කරන සාමාජිකයා/සාමාජිකයන් විසින් ඉතිරිව ඇති ධුර කාලය සඳහා පමණක් ධුරය දැරිය යුතු ය.

6\. (1) 7 (1) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සභාපතිවරයාගේ ධුර කාලය අධිකාරියේ ඔහුගේ සාමාජිකත්ව කාල සීමාව වන්නේ ය. *මණ්ඩලයේ සභාපතිවරයාගේ ධුර කාලය.*

(2) රෝගාතුර වීමකින් හෝ වෙනත් අබලතාවයක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීමේ හේතුවෙන් හෝ තම ධුර කාලය ඉටු කිරීමට සභාපතිවරයාට තාවකාලිකව නොහැකි වුවහොත් ඔහු වෙනුවට ක්‍රියා කිරීමට අමාත්‍යවරයා විසින් 3(ආ) (ii) විධිවිධානයන්ට යටත්ව කළමනාකරණ මණ්ඩල සාමාජිකයෙකු පත් කළ හැකිය.

(3) සභාපතිවරයා විසින් අමාත්‍යවරයා වෙත යොමු කරන ලද ලිපියක් මගින් සභාපති ධුරයෙන් ඉල්ලා අස් විය හැකිය.

(4) අමාත්‍යවරයා විසින් සභාපතිවරයාගේ ක්‍රියා කලාපය පිළිබඳ සෑහීමකට පත් නොවන විට ප්‍රධාන අමාත්‍යවරයා විමසා සභාපතිවරයාගේ පත් වීම අවසන් කරනු ලැබිය හැකි ය.

(5) මණ්ඩලයේ සියලු රැස්වීම්වලදී සභාපතිවරයා මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමකදී සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින කළමනාකරණ මණ්ඩල සාමාජිකයෙකු විසින් ඒ රැස්වීමේ මූලාසනය දැරීමට ඔවුන් අතරින් එක් සාමාජිකයෙකු තෝරා පත්කර ගත යුතු ය.

7\. (1) කවර හෝ පත්කළ සාමාජිකයකු කිසි හේතුවක් නොදන්වා, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි අතර, ඒ ඉවත් කිරීම කිසිම අභියෝගයකට ලක් නොකළ යුතු ය. *සාමාජිකත්වයෙන් ඉවත් කිරීම.*

(2) අධිකාරියේ සාමාජිකයකු සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් ඉහත (1) උපවගන්තිය යටතේ නියමයක් කරනු ලැබූ දින සිට එකී සාමාජිකයාගේ ධුරය හිස් වූවා සේ සලකා කටයුතු කළ යුතු ය.

(3) ඉල්ලා අස් වන බවට අමාත්‍යවරයා වෙත ලිපියක් යැවීමෙන් අධිකාරියේ පත් කළ සාමාජිකයකුට, සාමාජිකයකු වශයෙන් වූ හෝ සභාපති වශයෙන් වූ හෝ ස්වකීය ධුරයෙන් ඕනෑම අවස්ථාවකදී ඉල්ලා අස්විය හැකිය.

(4) අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සියලුම සාමාජිකයන්ට හෝ සාමාජිකයන්ගෙන් කිසිවකුට මුදල් විෂය භාර ලේකම්වරයාගේ එකඟත්වය ඇතිව වරින් වර නිකුත් කරන විධිවිධාන හා පළාත් භාණ්ඩාගාරය විසින් නිකුත් කරනු ලබන චක්‍රලේඛ, උපදෙස් හා විධිවිධානවලට අනුකූලව පාරිශ්‍රමික, දීමනා හා වෙනත් වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකිය. *කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවීම.*

මණ්ඩලයේ කාර්ය පරිපාටිය.

8. (1) මණ්ඩලයේ යම් රැස්වීමක ගණ පූරණය සඳහා සාමාජිකයන් සිව් දෙනෙකු සිටිය යුතුය.

(2) මණ්ඩලයේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීම හෝ එහි සාමාජිකයන් පත් කිරීම දෝෂ සහිත වීම යන හේතු නිසා මණ්ඩලයේ යම් කිසි ක්‍රියාවක් හෝ ක්‍රියාවලියක් බල රහිත යයි නොවිය යුතුයි.

(3) කළමනාකරණ මණ්ඩලයේ රැස්වීමක් අවම වශයෙන් මසකට වරක් හෝ පැවැත්විය යුතුය.

*(අ)* සෑම මණ්ඩල රැස්වීමක් පිළිබඳ ලිඛිත දැන්වීමක් එක් එක් සාමාජිකයාට රැස්වීම් දිනට දින 03කට පෙර ලැබෙන්නට සැලැස්විය යුතු අතර, එම රැස්වීමේදී කිරීමට නියමිත කාර්යයන් කවරේදැයි එහි සඳහන් විය යුතුය,

*(ආ)* මණ්ඩලයේ රැස්වීමක් කැඳවන ලෙසට අවම වශයෙන් සාමාජිකයින් දෙදෙනෙකු අත්සන් කර ඉදිරිපත් කරන ලිපියක් මගින් ඉල්ලා සිටියහොත් සභාපතිවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතු ය,

*(ඇ)* ඇමතිවරයා විසින් පත් කරන මණ්ඩල සාමාජිකයෙකු අවසර නොමැතිව නොකඩවා රැස්වීම වාර තුනකට සහභාගි නොවූයේ නම් එකී සාමාජිකයාගේ සාමාජිකත්වය අහෝසි වේ.

(4) අධිකාරියේ කටයුතු කළමනාකරණ මණ්ඩලය විසින් පරිපාලනය කළ යුතුය.

(5) අධිකාරියේ කටයුතු කාර්යක්ෂමව පාලනය කිරීම සඳහා අවශ්‍ය ස්වකීය බලතල සහ කාර්ය, කළමනාකරණ මණ්ඩලය විසින් සභාපතිවරයාට, අධ්‍යක්ෂවරයාට හෝ අධිකාරියේ සේවා නියුක්තිකයෙකුට පවරා දිය හැකිය.

කළමනාකරණ මණ්ඩලයේ ලේකම්.

(6) අධිකාරියේ සේවා නියුක්තිකයන් අතරින් සුදුසු නිලධාරියෙකු කළමනාකරණ මණ්ඩලයේ ලේකම්වරයා වශයෙන් පත් කළ හැකිය.

(7) යම් කරුණක් සම්බන්ධයෙන් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ඡන්දය සම ලෙස බෙදීමක් ඇති වුවහොත් ''එම අදළ රැස්වීමේ මූලාසනය දරන පුද්ගලයාට'' තීරක ඡන්දයක් හිමි විය යුතු ය.

## II වන කොටස

## අධිකාරියේ අරමුණු හා බලතල

9. අධිකාරියේ අරමුණු පහත පරිදි වේ.

අධිකාරියේ අරමුණු.

(1) පළාත තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවා ස්ථාපනය කිරීම මගින් මහජනතාව වෙත අන්තර්ජාලය සහ අනෙකුත් නව තාක්ෂණයන් හරහා රාජ්‍ය සේවාවන් සැලසීම හා පළාතේ ඉ-රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම,

(2) පළාතට අදළ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති සැලසුම් කිරීම, සංවර්ධනය, ස්ථාපනය හා පවත්වා ගෙන යාම,

(3) පළාත් සභාවේ සේවා කාර්යක්ෂමතාව වර්ධනය කිරීමට සහ ක්‍රියාවලින් ස්වයංක්‍රීය කිරීමට මෘදුකාංග පද්ධති ස්ථාපනය කිරීම,

(4) පළාත් සභාවේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සඳහා වෙබ් අඩවි සහ ජාල නිර්මාණය කිරීම,

(5) පළාත් සභාවේ සියලුම ආයතන සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ යටිතල පහසුකම් ස්ථාපනය කිරීම සහ කළමනාකරණය,

(6) පළාත් සභාවේ නිලධාරීන් සඳහා පරිගණක අධ්‍යාපනය ලබාදීම සහ පුහුණු කිරීම,

(7) පළාත තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ විෂයය හා පරිගණක විද්‍යාව පිළිබඳ දැනුම ප්‍රචලිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම,

(8) පළාත තුළ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්පත් සංවර්ධන කටයුතුවල නිරතව සිටින ආයතනවලට තාක්ෂණික උපදේශන සේවාවන් හා වෙනත් සහායන් ලබා දීම,

(9) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණික කටයුතු සම්බන්ධව අධිකාරියේ සේවය අපේක්ෂිත පෞද්ගලික අංශයේ හෝ වෙනත් ආයතන සඳහා සේවා ගාස්තුවක් අය කරමින් සේවා සැපයීම.

10. අධිකාරියේ බලතල පහත සඳහන් පරිදි වේ :

(1) අධිකාරියේ අරමුණු හා කාර්යයන් ඉටුකරගැනීම සඳහා චංචල හෝ නිශ්චල දේපළක් මිලට ගැනීම, බද්දට හෝ කුලියට දීම හෝ ගැනීම, උකස් කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම, අධිකාරියේ බලතල.

(2) අධිකාරියේ බලතල ක්‍රියාත්මක කිරීම සහ අධිකාරයේ අරමුණු ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වන ගිවිසුම්වලට, එළඹීම හා කොන්ත්‍රාත්වලට එළඹීම,

(3) අධිකාරිය යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ ප්‍රවීණයන් ස්ථිර හෝ පැවැරුම් පදනම මත බඳවා ගැනීම සහ එම ව්‍යාපෘතීන් මගින් උපයන ආදායම උපයෝගී කර ගෙන ඔවුන්ට කළමනාකරණ මණ්ඩලය තීරණය කරනු ලබන දීමනාවක් ගෙවීම,

(4) අධිකාරිය විසින් පළාත් සභාව තුළ හෝ ඉන් පිටතට සපයනු ලබන සේවාවන් සඳහා කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශ මත ගාස්තු නියම කිරීම හා අය කිරීම,

(5) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ සංවර්ධන කටයුතුවලට අදළ පර්යේෂණ පැවැත්වීම, ඒ සඳහා සහාය දීම, සම්බන්ධීකරණය හා අනුබල දීම,

(6) තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයට අදළ ව්‍යාපාරික කුසලතා පිළිබඳ පුහුණු කටයුතු හා අධ්‍යාපනික කටයුතු කරගෙන යාම, පුහුණු වැඩසටහන්, සම්මන්ත්‍රණ, සම්මේලන, වැඩමුළු, අධ්‍යයන චාරිකා සහ දැනුම හා තොරතුරු පතුරවාලීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම,

(7) අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ඇතිව අධිකාරියට අවශ්‍ය උපකාර්යාල හා මධ්‍යස්ථාන පවත්වාගෙන යාම,

(8) ඉහත 9 වගන්තියේ සඳහන් අරමුණු ඉටු කර ගැනීමට ඉවහල් වන පරිපාලන සහ මූල්‍ය රීති සැකසීම,

(9) සිය සේවකයන් සඳහා කාර්ය නියමයන් ඇති කිරීම, ඔවුන්ගේ කාර්ය සාධනය ඇගයුම් සහ අවශ්‍ය පිළියම් යෙදීම,

(10) අධිකාරියේ අරමුණු සපුරා ගැනීම සඳහා අවශ්‍ය යන්ත්‍ර සූත්‍ර සහ උපකරණ මිලදී ගැනීම,

(11) ජාතික හා පළාත් සභා ප්‍රතිපත්තිවලට අනුකූලව, අරමුදල්, තාක්ෂණික විශේෂඥ ඥානය හෝ වෙනත් ආධාර ලබා ගැනීම,

(12) අවස්ථාවෝචිත පරිදි අධිකාරියේ මුදල්වලින්, යම් මුදල් ප්‍රමාණයක්, මුදල් විෂය භාර ඇමතිවරයාගේ අනුමැතිය ඇතිව ආයෝජනය කිරීම.

11. (1) අධිකාරිය සතු මුද්‍රාව මෙම ප්‍රඥප්තීන් 13(1) යටතේ පත්වන අධ්‍යක්ෂ භාරයේ තබා ගත යුතු ය. අධිකාරියේ මුද්‍රාව.

(2) අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරිපිට දී හැර කිසිම සාධන පත්‍රයකට හෝ ලියවිල්ලකට අධිකාරයේ මුද්‍රාව නොතැබිය යුතු අතර, තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ දෙදෙනා විසින් ඒ සාධන පත්‍රයට හෝ ලේඛනයට තම අත්සන තැබිය යුතුය,

(3) මුද්‍රා තබන ලේඛන හා ලියකියවිලි පිළිබඳ ලේඛනයක් අධිකාරිය විසින් එය ආරම්භ කරන දින සිටම පවත්වා ගෙන යා යුතුය,

අධිකාරිය සම්බන්ධයෙන් අමාත්‍යවරයාගේ බලතල.

12. අධිකාරියේ අරමුණු ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් විෂයභාර අමාත්‍යවරයා විසින් අධිකාරියට ලිඛිත විධාන දෙනු ලැබිය හැකි අතර, අධිකාරිය විසින් ඒ විධාන ක්‍රියාවේ යෙදිය යුතුය.

## III වන කොටස

## අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරි හා වෙනත් කාර්ය මණ්ඩලය

අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා.

13. (1) අධිකාරියේ ප්‍රධාන විධායක නිලධාරියා වශයෙන් මෙම ප්‍රඥප්තියේ මින් මතු අධ්‍යක්ෂවරයා වශයෙන් හඳුන්වන, අනුමත බඳවා ගැනීමේ පරිපාටිය අනුව බඳවා ගනු ලබන පූර්ණ කාලීන තැනැත්තෙකු කළමනාකරණ මණ්ඩලය විසින් පත් කළ යුතුය.

(2) අධිකාරියේ කටයුතු අධීක්ෂණය කිරීම අධිකාරයේ බලතල කටයුතු හා කාර්යයන් සංවිධානය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ අධිකාරියේ සේවා නියුක්තිකයන්ගේ පරිපාලනය, කළමනාකරණ මණ්ඩලයේ සාමාන්‍ය විධිවිධානයට සහ පාලනයට යටත්ව අධ්‍යක්ෂකවරයා වෙත පැවරේ.

අධිකාරියේ සෙසු කාර්ය මණ්ඩලය.

(3) ස්වකීය කර්තව්‍යය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍යයයි අධිකාරිය සලකනු ලබන සෙසු නිලධරයන් සහ සේවකයන් අනුමත බඳවා ගැනීම් පරිපාටියට යටත්ව අධිකාරිය විසින් පත් කරනු ලැබිය හැකිය.

(4) රජයේ සේවයේ නියුක්ත යම් නිලධාරියෙකු අධිකාරියේ ඉල්ලීම පිට ඒ නිලධාරියාගේ සහ අදළ නිලධාරියාගේ පත් වීම් බලධාරියාගේ කැමැත්ත ඇතිව අධිකාරිය නිශ්චය කරනු ලබන කාල සීමාවක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකිය.

## IV වන කොටස

## අධිකාරියේ අරමුදල හා ගිණුම්

අධිකාරියේ අරමුදල.

14. අධිකාරිය නමින් අරමුදලක් තිබිය යුතුය. එම අරමුදලට,

(1) ප්‍රදන වශයෙන් පළාත් සභාව විසින් අධිකාරියට විසර්ජනය කරන ලද මුදල්,

(2) මේ ප්‍රඥප්තිය යටතේ නියම කොට එකතු කරන ලද සියලු මුදල්,

(3) ගාස්තු හා අය කිරීම් වශයෙන් අධිකාරිය විසින් භාර ගන්නා ලද සියලු මුදල්,

(4) ශ්‍රී ලංකාවෙන් හෝ ඉන් පිටත හෝ කවර හෝ ප්‍රභවයන්ගෙන් පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදන හෝ වෙනත් ආකාරයකින් ලැබෙන සියලු මුදල්,

(5) අධිකාරිය සතු දේපළ, වත්කම්, භාණ්ඩ හා උපකරණ විකිණීමෙන්, කුලියට දීමෙන්, බදු දීමෙන් හෝ බැහැර කිරීමෙන් ලැබෙන සියලු මුදල්,

(6) යම් විශේෂ ව්‍යාපෘති ඉටු කිරීම හෝ යම් කාර්යයන් ඉටු කිරීම සඳහා හෝ පළාත් සභා අරමුදලින් හෝ පළාත් පාලන ආයතන වලින් හෝ වෙනත් යම් ආයතනයකින් ලැබෙන මුදල්,

(7) අධිකාරිය සතු මුදල් ආයෝජනය කිරීමෙන් හෝ තැන්පත් කිරීමෙන්, ලාභය, වාරික හෝ වෙනත් ආකාරයකින් ලැබෙන මුදල්,

(8) වෙනත් කවර හෝ නීත්‍යානුකුල ප්‍රභවයකින් ආයතනයට ලැබෙන මුදල්, බැර විය යුතුය.

15. අරමුදලින් පහත කරුණු සඳහා ගෙවීම් කළ හැකිය.

අරමුදලින් ගෙවීම.

(1) අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයින්ට ගෙවිය යුතු පාරිශ්‍රමික,

(2) අධිකාරියේ නිලධාරීන්ට, සේවකයින්ට සහ සේවා නියුක්තිකයින්ට ගෙවිය යුතු වැටුප්,

(3) අධිකාරියේ සේවා සපයන්නන්ට ගෙවිය යුතු ගෙවීම් හා පාරිශ්‍රමික,

(4) ස්වකීය බලතල කාර්ය සහ කර්තව්‍යය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සම්බන්ධයෙන් පළාත් මූල්‍ය රෙගුලාසි අනුව අධිකාරිය විසින් දරන ලද වියදම්,

16. අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතුය. මුදල් වර්ෂය.

17. අධිකාරියේ ආදායම් හා වියදම් සම්බන්ධයෙන් ද වත්කම් හා බැරකම් සම්බන්ධයෙන් ද ගිණුම් හා පොත් පත් පවත්වා ගෙන යා යුතුය. අධිකාරියේ ගිණුම්.

18. සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. එම ප්‍රකාශන ඊළඟ වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපතිට ඉදිරිපත් කළ යුතු ය. මූල්‍ය ප්‍රකාශන

19. සෑම වර්ෂයකම දෙසැම්බර් මස 31 දිනට ආයතනයේ සියලු වත්කම් හා දේපළ, භාණ්ඩ සමීක්ෂණයට භාජනය විය යුතු ය.

20. සෑම වර්ෂයක් ම ආරම්භ වීමට ප්‍රථම අදාළ වර්ෂය සඳහා ඇස්තමේන්තුවක් පිළියෙළ කර වර්ෂය ආරම්භ වීමට පෙර කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය ලබා ගත යුතු ය.

21. විගණනය කරන ලද ගිණුම් සහ විගණකාධිපතිගේ වාර්තාව එක් එක් වර්ෂයේ දී ලැබුණු විට එම වාර්තාවන් ද, අදාළ මුදල් වර්ෂය තුළ දී අධිකාරිය විසින් කරන ලද කටයුතු පිළිබඳ වාර්තාවක් ද, අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු අතර, ඔහු විසින් එම වාර්තා කඩිනමින් පළාත් සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු ය.

## V වන කොටස

## පොදු කරුණු

22. (1) මෙම ප්‍රඥප්තිය යටතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට, බලාත්මක කිරීමට හා ගාස්තු අය කිරීමට අදළ සියලුම කරුණු හෝ යම් කරුණක් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ පැවරෙන බලතලවලට හානියක් නොමැතිව රීති සෑදීම විෂය භාර අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි ය.

(2) මෙම වගන්තිය යටතේ විෂය භාර අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම රීතියක්ම *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දින හෝ ඒ රීතියේ සඳහන් යම් දිනක සිට හෝ එය ක්‍රියාත්මක විය යුතු ය.

(3) විෂයභාර අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම රීතියක් ම, එය *ගැසට් පත්‍රයේ* පළ කිරීමෙන් පසු මාස තුනක් ඇතුළත අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ පළාත් සභාව විසින් අනුමත නොකරන ලද යම් රීතියක් එසේ අනුමත නොකිරීමට ගත් තීරණයේ දින පටන් පරිච්ඡන්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද යම් කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

## VI වන කොටස

## අන්තර්කාලීන විධිවිධාන

23. (1) මෙම ප්‍රඥප්තියට බස්නාහිර පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමතය ලැබූ දින සිට බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2000 අංක 06 දරන තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය මෙයින් පරිච්ඡින්න කරනු ලැබේ.

(2) එසේ වුව ද 2000 අංක 06 දරන තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනය සතුව තිබූ ;

(අ) සියලු චංචල හා නිශ්චල දේපළ, සහ

(ආ) සියලු වත්කම් හා බැරකම්,

මෙම ප්‍රඥප්තිය යටතේ අධිකාරිය සතු චංචල හා නිශ්චල දේපළ, වත්කම් හා බැරකම් වශයෙන් සැලකිය යුතු ය.

(3) 2000 අංක 06 දරන තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් මෙම ප්‍රඥප්තිය යටතේ ඉටු කරනු ලැබූ කාර්යයන් ලෙස සැළකිය යුතු ය.

(4) තව ද 2000 අංක 06 දරන තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ප්‍රඥප්තිය යටතේ පිහිටුවන ලද බස්නාහිර පළාතේ තොරතුරු තාක්ෂණ සම්පත් සංවර්ධන ආයතනයේ නිලධරයන් හෝ සේවකයන් මෙම අධිකාරියේ නිලධරයන් හෝ සේවකයන් වශයෙන් සැළකිය යුතු ය.

අර්ථ නිරූපණ වගන්තිය.

24. මෙම ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස ''අමාත්‍යවරයා'' යන්නෙන් බස්නාහිර පළාතේ පළාත් සභාවේ තොරතුරු තාක්ෂණ විෂය භාර අමාත්‍යවරයා අදහස් වන්නේ ය.

අනනුකූලතාවයක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

25. මෙම ප්‍රඥප්තියේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර, අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

10 - 670

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.